# බටහිරයන්ට කන් කෙඳිරිගෑම

අපට බොහෝ විට ඉංගිරිසි කතාකරන සිංහලයන්ගෙන් අසන්නට ලැබෙන කියමනක් නම් දෙමළ ජාතිවාදී ප්‍රශ්නය සම්බන්ධයෙන් ඉංගිරිසින්ට නොර්වේජියානුවන්ට, ඇමරිකානුවන්ට හා වෙනත් බටහරයන්ට දොස් කීම වැරැදි බවත් දෙමළ ජාතිවාදයට සිංහලයන් පාවා දෙන්නේ එ. ජා. ප. හා ශ්‍රී. ල. නි. ප. නායකයන් බවත්ය. එ. ජා. ප. හා ශ්‍රී. ල. නි. ප නායකයන් පමණක් නොව වික්‍රමබාහුලාද, වාසුදේවලාද, නිමල්කාලා ද, කාලෝලා ද, බැටිලා ද, සූවරිතලා ද, අයිවන්ලාද, ගණනාත්ලාද, විජේ ඩයස්ලා ද, අන්ද්‍රාදිලා ද, උයන්ගොඩලා ද කීරවැල්ලලාද, දයාන්ලා ද නිර්මාල්ලාද, (ඊනියා පශ්චාත්නූතනවාදීහු) හඳගමලා ද ආදී වශයෙන් දෙමළ ජාතිවාදය ඉදිරියේ වැඳ වැටෙන්නෝ බොහෝ වෙති. මේ සියලු දෙනාට ම පැවැත්මක් ඇත්තේ බටහිරයන් නිසාය. බටහිර දේශපාලනඥයන් හා බටහිර ඊනියා සමාජයීය විද්‍යාඥයන් නොවන්නට මේ එක් අයකුටවත් පැවැත්මක් නැත. මෙහි නම් සඳහන් බුද්ධිමතුන් යැයි සැලකෙන කිසිවකු සම්ම ජාතියේ නව ප්‍රවාදයක් නව සංකල්පයක් නිර්මාණය කර නැති වුවද සිංහලයන් සමස්තයක් වශයෙන් ගත්කල ප්‍රවාද නිර්මාණයෙහි දක්වන දුර්වලතාවය හා ප්‍රවාද හඳුනාගෙන ප්‍රවාදාත්මක ව නොසිතීමද බටහිර සංස්කෘතික ආධිපත්‍යය ද හේතුකොටගෙන බටහිර කසිකබල් මතවාද මෙරට වපුරන්නෝ බුද්ධිමතුන් ලෙස සැලකෙති. තමන්ගේ දෙපයින් නැගී සිටීමට නොහැකි මොවුහු බොල් පිළිම වෙති. මේ බොල් පිළිම නිර්මාණය කරන ලද්දේ බටහිරයන් විසිනි.

මේ බොල් පිළිම එකින් එක ගෙන සුණු විසුණු කිරීම එතරම් අපහසු කාර්යයක් නොවේ. මින් අදහස් කරන්නේ බොල් පිළිමවල ජීවිතවලට අබමල් රේණුවකින් හෝ පීඩාවක් නොකිරීම බව අවධාරණය කළ යුත්තේ මේ බොල් පිළිම එවැනි කරුණක් මත හේත්තු වී පුහු වීරයන් වීමට දඟලන බැවිනි. බොල් පිළිම සුණු විසුණු කිරීම අපහසු කාර්යයක් නොවුවත් එක පැත්තකින් ඒ සඳහා ලිපි ගණනාවක් වැය කිරීමට සිදු වෙයි. ඉඩ ලැබෙන පරිදි එවැනි ලිපි ලියනවා හැරෙන්නට ඒ සඳහා විශේෂයෙන් ලිපි ලිවීම අනවශ්‍යවන්නේ ශාස්ත්‍රීය වශයෙන් ගත්කල ඔවුන් එතරම් වැදගත් පුද්ගලයන් නොවන නිසාය. එහෙත් ලිපි නොලියා සිටීමටද නොහැකි වන්නේ ඔවුන් හරහා ප්‍රවාද නොහඳුනන සිංහලයන්ට යම් බලපෑමක් කිරීමට බටහිරයන් කැමැති නිසාය.

ඒ කෙසේ වෙතත් මේ ලිපියෙහි අරමුණ ප්‍රධාන දේශපාලන පක්‍ෂවල දේශපාලනඥයන් ගැන කතා කිරීමය. රනිල් වික්‍රමසිංහ, චන්ද්‍රිකා කුමාරතුංග අද දෙමළ ජාතිවාදයට රට පාවා දීමට කටයුතු කරන බව සැබෑය. ඔවුහු බටහිරයන් ඉදිරියේ වැඳ වැටෙති. මොවුන් දෙදෙනා ම එකම ප්‍රමාණයට බටහිරයන් ඉදිරියේ වැඳ වැටෙන බවක් මෙයින් නොකියැවෙයි. පැරණුටයෙන් බස්සවා නායිකාව බවට පත් කරන ලද නමුදු චන්ද්‍රිකා කුමාරතුංග ශ්‍රී. ල. නි. පක්‍ෂයේ ස්වභාවය හේතුකොටගෙන රනිල් වික්‍රමසිංහ තරමටම බටහිරයන්ට වැඳ නොවැටෙයි. එබැවින් ඇතැම් අවස්ථාවල රනිල් වික්‍රමසිංහට හා එ. ජා. ප.යට එරෙහිව චන්ද්‍රිකා කුමාරතුංගට සහාය දීමට අපට සිදුවෙයි. එහෙත් ඔවුන් දෙදෙනාටම ඇත්තේ බටහිර මතවාද පමණය. එබැවින් ඔවුන් සිතන්නේ බටහිරයන්ට අවශ්‍ය ආකාරයකටය. මාක්වාදය ලිබරල් වාදය හෝ බටහිර වෙනත් ඕනෑම වාදයක් වේවා යොදා ගන්නා පුද්ගලයා අවසානයේදී බටහිරයන් වෙනුවෙන් කඩේ යයි. බටහිර ප්‍රවාද අනුව සිතන්නා බටහිරයන්ගේ රූකඩයක් පමණකි. එලෙස සිතන්නන් තමන්ට අවශ්‍ය අන්දමට අවසානයේ දී ක්‍රියා කරන බව බටහිරයෝ දනිති. රනිල් වික්‍රමසිංහ හා චන්ද්‍රිකා කුමාරතුංග පමණක් නොව ටිල්වින් සිල්වා ද බටහිර මතවාද අනුව සිතන්නේ නම් අවසානයේදී බටහිරයන් විසින් පාලනය කෙරෙනු ඇත. රනිල් වික්‍රමසිංහගේ බටහිර ගැතිකම ලෝක මට්ටමේ එකක් බව පසුගිය දා නැවතත් හෙළිදරව් විණි. ෆෝක්ලන්ත ආක්‍රමණයේ දී මාග්‍රට් තැචර්ට සහාය දුන් තම මාමා වූ ජේ. ආර්. ජයවර්ධන අනුගමනය කරමින් රනිල් වික්‍රමසිංහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දී ඉරාක ආක්‍රමණය සම්බන්ධයෙන් බුෂ්ට හා බ්ලෙයාර්ට සහාය දී ඇත. පසුගිය වසර කිහිපය තුළ විදෙස් බලවතුන් ඉදිරියේ ලංකාව මේ තරම් නින්දිතතත්වයකට පත් වූ තවත් අවස්ථාවක් නැත. එහෙත් මොවුන්ට ඒ පිළිබඳ කිසිදු වග විභාගයක් නැත. මේ ඊනියා නායකයන්ගේ අද උත්සාහය නොබෙල් තෑගි ඇතිව හෝ නැතිව ජාතිය පාවාදීමටය. ඒ පිළිබඳ විවාදයක් නැත. එහෙත් මොවුන් එලෙස ජාතිය පාවාදීම සඳහා කටයුතු කළ ද බටහිරයන් ඒ පිළිබඳව නිදොස් යැයි එයින් කිසිසේත්ම ගම්‍ය නොවේ.

© Prof. Nalin De Silva

ඇතැම් ඉංගිරිස් කතාකරන සිංහලයන්ගේ අදහස වී ඇත්තේ බටහිරයන් කටයුතු කරන්නේ මෙරට ඊනියා නායකයන්ගේ අවශ්‍යතාව උඩ බවය. ඔවුන් සිතන්නේ රනිල් වික්‍රමසිංහ හා ඊනියා ආණ්ඩුව දෙමළ ජාතිවාදයට විරුද්ධ වුවහොත් එවිට බටහිරයන් ද දෙමළ ජාතිවාදයට විරුද්ධ වන බවය. ඔවුන්ට අනුව බටහිරයන් දෙමළ ජාතිවාදයට විරුද්ධව කිසිවක් නොකරන්නේ ඊනියා ආණ්ඩුව එයට විරුද්ධව කිසිවක් නොකරන බැවින්ය. එහෙත් මේ එක්කෝ බටහිරයන් ගැන නොදැන කරන ප්‍රකාශයකි. නැත්නම් තම පුද්ගල අවශ්‍යතා වෙනුවෙන් බටහිරයන් සතුටු කිරීමට කරන ප්‍රකාශයකි. බටහිරයන් වැඩ කරන්නේ තමන්ට අවශ්‍ය ආකාරයට මිස ඒ ඒ රටවල ආණ්ඩුවලට අවශ්‍ය ආකාරයට නොවේ.

ඇතැමුන් පවසන ආකාරයට අප බටහිරයන්ට කරුණු පැහැදිලි කර දෙන්නේ නම් එවිට ඔවුන් දෙමළ ජාතිවාදයට හා කොටි සංවිධානයට විරුද්ධ වනු ඇත. ඒ මතය අනුව බටහිරයෝ කරුණු නොදනිති. ඔවුන් දන්නේ ඊනියා ආණ්ඩුව හා උගතුන් යැයි කියාගන්නවුන් දෙමළ ජාතිවාදය ගැන කියන දේය. එබැවින් අප කළ යුත්තේ නිවැරැදි කරුණු ඔවුන් හමුවේ තබා ඔවුන් වෙනස් කිරීමට කටයුතු කිරීමය. බටහිරයන් ප්‍රභාකරන්ට ආධාර කරන්නේ ඔහු පැසිස්ටවාදියකු බව නොදැන නොවේ. දෙමළ කොටි ත්‍රස්තවාදී සංවිධානය ගැන ඔවුහු හොඳහැටි දනිති. එහෙත් ඔවුහු කොටි සංවිධානයවත් ප්‍රභාකරන්වත් තවමත් අත් නොහරිති. පසුගිය අවුරුදු පණහ ඇතුළත බටහිරයන් ආධාර කළ පවත්වාගෙන ගිය එකම පැසිස්ට්වාදියා ප්‍රභාකරන් නොවේ. වියට්නාමයේ ඩින් ඩියම්, පිලිපීනයේ මාර්කෝස්, උගන්ඩාවේ ඉඩි අමින් එහි දී සිතට එන නම් කිහිපයක් පමණකි. බටහිරයෝ ඊනියා ප්‍රජාතන්ත්‍රවාදයක් ගැන කතාකරන අතර ම තම රටවලද විවිධ රටවල ද ඒ ඒ මට්ටමේ ජනාධිපති රාජ්‍ය පවත්වාගෙන යති.. ඔවුන්ට ඇත්තේ එකම එක ප්‍රතිපත්තියක් පමණකි. ඒ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික, ආර්ථික හා දේශපාලනික යටත්විජිතවාදය ලෝකය පුරා පවත්වාගෙන යෑමය. ඒ අවශ්‍යතාව ඉටුවන තෙක් හෝ ඉටුකර ගැනීමට උපකාරී වන තෙක් ඔවුහු ඕනෑම අයකුට සහාය දෙති. එහෙත් ඒ පුද්ගලයා තමන්ගේ ව්‍යාපෘතියට බාධාවක් වන්නේ නම් ඒ තැනැත්තාගේ වරදක් පෙන්වා අත්හැර දැමීමටද බටහිරයෝ පසුබට නොවෙති. ඔවුන්ට ඇත්තේ බටහිර ආධිපත්‍යය පිළිබඳ ප්‍රශ්නය පමණකි. ප්‍රභාකරන් තම ආධිපත්‍ය පවත්වාගෙන යෑමට බාධාවක් වූ දින බටහිරයන් ඔහු අත්හරිනු ඇත. එතෙක් ඔහු පවත්වාගෙන යනු ඇත.

මේ දිනවල කැනඩාවේ විදේශ ඇමැතිවරයා ලංකාවට පැමිණ ඇත. කැනඩාව දෙමළ ජාතිවාදයට ආධාර කරන ප්‍රධාන රටක් වෙයි. එයට හේතුව මෙරටින් එරටට ගොස් ඇති දෙමළ ජනයාගේ සංඛ්‍යාවේ විශාලත්වය හා ඔවුන් කැනඩාවේ යම් බලපෑමක් ඇති කිරීමට සමත්වීම යැයි යමකු පැවසීමට ඉඩ ඇත. එහෙත් මූලිකවම එපමණ සංඛ්‍යාවක් දෙමළ ජනයාට කැනඩාවට ඒමට ඉඩ සැලැස්සුවේ ඇයි ද යන්නය. කැනඩාව තවමත් කොටි සංවිධානය එරට තහනම් කර නැත. එහෙත් කැනඩා විදේශ ඇමැතිවරයා වන්නියට ගොස් ප්‍රභාකරන් හමුවීම ප්‍රතික්ෂේප කර ඇත. මේ ඇස් බැන්දුම් පමණකි. ඇමැතිවරයා වන්නියේ දී හෝ වෙනත් තැනකදී ප්‍රභාකරන් හැරෙන්නට වෙනත් කිසිම කොටි සාමාජිකයකු මුණ නොනැගසෙන්නේ ද? මුණ නොනැගසුණත් අනියම් ආකාරයකට හෝ කොටි සමඟ සම්බන්ධකම් නොපවත්වන්නේ ද?

ඇමරිකා එක්සත් ජනපදය කොටි සංවිධානය එරට තහනම් කර ඇත. එහෙත් ඇමරිකාව විවිධ ආකාරයෙන් කොටි සමඟ අනියම් සම්බන්ධකම් පවත්වාගෙන යයි. නෝර්වේ රටෙහි කොටි තහනම් නැත. ඇමරිකාවට කොටි සමඟ කළ යුතු ඕනෑම දෙයක් අවශ්‍ය නම් නෝර්වේ හරහා කර ගත හැකිය. ඇමරිකාවේ දෙබිඩි ප්‍රතිපත්තිය මින් පැහැදිලි වෙයි. ඇමරිකාව එහි කොටි තහනම් කර ඇත්තේ කොටි ඇමරිකාවට විරුද්ධ ඇතැම් අරාබි සංවිධාන සමඟ සම්බන්ධකම් පවත්වාගෙන යන බැවිනි. ඒ අතර මෙරට සිංහලත්වයට පහර ගැසීම සඳහා ඔවුහු කොටි ත්‍රස්තවාදී සංවිධානය යොදාගනිති. ලංකාවේ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයට විරුද්ධ ප්‍රධාන බලවේග සිංහල බෞද්ධ බලවේගය මිස කසිකබල් මාක්ස්වාදී බලවේග නොවන බව බටහිරයෝ දනිති. ජනතා විමුක්ති පෙරමුණ අද දෙමළ ජාතිවාදයට විරුද්ධවන්නේ යම් ප්‍රමාණයකට එහි ඇති සිංහල බෞද්ධ නියෝජනත්වය නිසා මිස මාක්ස්වාදය නිසා නොවේ. අනෙක සියළුම මාක්ස්වාදීන් දෙමළ ජාතිවාදයට පක්ෂපාතී වෙද්දී ජනතා විමුක්ති පෙරමුණ එයට විරුද්ධ වන්නේ එහි සිංහල බෞද්ධ නියෝජන ත්වයෙක් ඇති බැවිනි. එහෙත් ජනතා විමුක්ති පෙරමුණේම ඇතැමුන් ඒ බව අවබෝධ කරගෙන නැත. බටහිරයන් වර්තමාන යෙහි සිංහලත්වයට එරෙහිව කොටි සංවිධානය යොදා ගැනීමේදී එහි ත්‍රස්තවාදී පැසිස්ට්වාදී දේශපාලනය නො සලකති.

© Prof. Nalin De Silva

අප බටහිරයන්ට කියා දිය යුත්තේ කුමක්ද? කොටි පැසිස්ට්වාදී සංවිධානයක් බව ඔවුහු දනිති. දෙමළ ජනයාට මෙරට නැති අයිතිවාසිකමක් නැති බව ඔවුහු නොදනිත්ද ලංකාවේ තරම් සුළුතර ජනවර්ගයකට අයිතිවාසිකම් දී ඇති වෙනත් රටක් බටහිරයන්ට බටහිරින් හෝ පෙන්විය හැකිද? දෙමළ භාෂාව රාජ්‍ය භාෂාව කෙරී ඇති එකම රට ලංකාවය. කෝටි සංඛ්‍යාත දෙමළ ජනකායක් වෙසෙන ඉන්දියාවවත් දෙමළ රාජ්‍ය භාෂාවක් කර නැත. දෙමළ පොලිස්පතිවරයකු විශ්‍රාම ගියේ මේ නොබෝදාය. දෙමළ කුඩා ව්‍යාපාරිකයකුගේ දියණියකගේ උපන් දින උත්සවයකට සහභාගි වීම හෙළි නොවන්නට ඔහු තවමත් පොලිස්පතිය. මෙරට වත්මන් නීතිපති දෙමළ ජනවර්ගයට අයත් වෙයි. හිටපු නීතිපතිවරයකු වූ පසුපති අද කොටි සංවිධානයේ නීති උපදේශකයෙකි. දෙමළ ජනයාට දෙමළ වීම නිසාම මෙරට අහිමි වී ඇත්තේ කුමක්ද මෙරට බලපවත්වන ක්‍රිස්තියානි රෝම ලන්දේසි නීතියේ සමාගම් නීතිය උපයෝගී කර ගනිමින් අද ගමක් ගමක් පාසා ඇමරිකන් මුදලින් ක්‍රිස්තියානි පල්ලි තනා සිංහලත්වයට පහර ගැසීමේ ව්‍යාපාරයක් ප්‍රබල ව ක්‍රියාත්මක වෙයි. පසුගිය දා කිසිම විරුද්ධත්වයක් නොමැතිව මෙරටට බ්‍රිතාන්‍යයන් විසින් ගෙන්වන ලද මෑත ඉන්දියානු සම්භවයක් සහිත දෙමළ ජනයාට පුරවැසිකම් ප්‍රදානය කෙරිණි.

මේ එකක්වත් ක්‍රිස්තියානි සංස්කෘතියට විරුද්ධව බටහිර රටක සිදුවිය හැකිදේ ද? ඇමරිකාවේ දෙමළ බසට නොව ස්පාඤ්ඤ බසට විරුද්ධව අවුරුදු කිහිපයකට ඉහත ඉංගිරිසි බස නිල වශයෙන්ම රාජ්‍ය භාෂාව බවට පත් කෙරිණි. නෝර්වේ රටේත් වෙනත් භාෂා තිබු ද රාජ්‍ය භාෂාව නෝර්විජියානු භාෂාව වෙයි. වයිකින්ග්වරුන්ට ඉහත සිට ම ජීවත්ව ලැප්ලැණිකයන්ගේ භාෂාව රාජ්‍ය භාෂාවක් නොවේ. ඇමරිකාවේ පුරවැසිකම ලබා ගත හැක්කේ එරට සුද්දන් (ඊනියා කාන්තා විමුක්තිකාරියන්ගේ දැන ගැනීම පිණිස සුදු පිරිමින්) විසින් ලියන ලද අවුරුදු තුන්සියයේ ඉතිහාසය දන්නේ නම් පමණකි. එහෙත් ලංකාවේ මහාවංශ ඉතිහාසය දැන නොසිටිය යුත්තක් බවට පත් කර ඇත. එයට හේතුව මහාවංශ ඉතිහාසය ථෙරවාදී ආධිපත්‍ය පිළිබිඹු කිරීම යැයි කියැවෙයි. මෙරට අද ඇත්තේ බටහිර ක්‍රිස්තියානි ආධිපත්‍යයක් බව ඉන් ඉබේටම කියැවෙයි. ඇමරිකන් ඉතිහාසය ලියා ඇත්තේ ඇංග්ලෝ සැක්සන් ක්‍රිස්තියානින් මිස එහි වෙසෙන ඊනියා රතු ඉන්දියානුවන් නොවේ. අද මෙරට ලියැවෙන්නේ ඇම්. පී. මැන්ඩිස් වැනි දේවගැතියන් ආරම්භ කළ ක්‍රිස්තියානි ඉතිහාසයක් බව බොහෝ දෙනා නොදනිති. (මෙය වෙනම සාකච්ඡා විය යුතු ප්‍රශ්නයකි.) ඇමරිකාව හෝ එංගලන්තයේ හෝ නගරයක් නගරයක් පාසා සමාගම් නීතිය උපයෝගී කරගනිමින් පන්සල් තැනිය හැකි නොවේ.

මෙරට දෙමළ ජනයාට එංගලන්තයේ හෝ ඇමරිකාවෙ හෝ නැති අයිතිවාසිකම් ඇති බව දෙමළ ජනයා මෙන්ම සුද්දෝ ද දනිති. ඔවුන්ට ඒ බව කියා දිය යුතු නොවේ. මෙරට දෙමළ ජාතිවාදය නිර්මාණය කරන ලද්දේම ලන්දේසීන් විසිනි. බ්‍රිතාන්‍යයෝ දෙමළ ජාතිවාදය පෝෂණය කළහ. අද දෙමළ ජාතිවාදයත් ප්‍රභාකරන්වත් මෙරට ඊනියා ආණ්ඩුවත් යන සියල්ල පවත්වාගෙන යනු ලබන්නේ බටහිරයන් විසිනි. ඊනියා ආණ්ඩුවටද කසිකබල් බුද්ධිමතුන්ටද න්‍යාය ප්‍රවාද උපදෙස් සැපයෙන්නේ ද බටහිරිනි. එබැවින් සිංහලයන්ගේ නිදොස්කම ගැන බටහිරයන්ට කන්කෙඳිරි ගෑමෙන් පලක් නැත. කළ යුත්තේ බටහිරයන් හෙළිදරව් කිරීමක් මගින් සිංහලයන් අදහස්වලින් තව තවත් සන්නද්ධ කිරීම පමණකි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva